**<u>පාස්කුව යනු අයුක්තිය සහ අසාධාරණයට එරෙහිව යේසුන් තුල දෙවියන් වහන්සේගේ නැගී සිටීමයි.</u>**

“දෙවියන් වහන්සේ මෙම යේසුස් වහන්සේ මරණයෙන් උත්ථාන කොට වදාළ සේක. එයට අපි සියල්ලෝම සාක්ෂිකාරයෝ වෙමු.” (ක්‍රි.යා.2:32)

දෙවියන් වහන්සේ දී ඇති සම්පත් අයුතු ලෙස පරිහරණය කරන ලෝකයක අප ජීවත් වන්නෙමු. මෙය ලෝක මට්ටමින් පමණක් නොව දේශීය වශයෙන්ද අපි දකිමු. බයිබලය තුලින් තමන්වම අනාවරණය වන දෙවියන්, ලෝකයේ දුක්විදීම් පැත්තට වී බලා සිටින දෙවි කෙනෙකු නොවේ. දේව ස්වරූපයෙන් මවන ලද ජනතාවගේ වේදනාව සහ අසාධාරණය ඇසෙන, දකින දෙවියන් ගැලවුම්කාර දෙවියන් ලෙස මෙලොවට පැමිණේ.

මෙම දෙවියන් පාරාවෝගෙන් දේව ජනතාව මුදා ගැනීමට මෝසෙස්ව එවන ලද දෙවියන්ය. පාරාවෝ ඉදිරියේ මෝසෙස්ගේ කෙදිරිගෑම වූයේ නික්ම :8: 1 “එවිට සමිදාණන් වහන්සේ මෝසස්ට කතා කොට, “පාරාවෝ වෙත ගොස්, ඔහු අමතා, සමිදාණන් වහන්සේගේ පණිවුඩය මේ ය: මට වැඳුම් පිදුම් කරන පිණිස මාගේ සෙනඟට යන්න අවසර දෙන්න”

මිනිසා විසින් නිමර්ාණය කරන ලද හේතූන් නිසා දුක් විදින ජනතාව මුදා ගැනීමට යේසුස් (දෙවියන් අප සමඟ : මතෙව් 1: 23 – 24) එවන ලද්දේ මෙම දෙවිඳුන් විසිනි. මේ අනුව අද ලෝකයේ ජනතාව දුක් විදින්නේ ඔවුන් සිදුකල පාපයේ දඬුවමක් ලෙස නොවේ. අයුක්තියේ බලය ලබාගෙන සිටින ජනතාව සහ රටවල්, ඔවුන්ට විරුදධව පව් කර ඇත. ඒ අනුව මිනිසා දිලිදු වන්නේ තමන් කල පව් නිසා නොවේ. බලයේ සිටින ජනතාව ඔවුන් වෙනුවෙන් පව්කර ඇති නිසාය.

දුක්විදින මනුෂ්‍යාත්වය ගලවා ගැනීමට ක්‍රිස්තුස් ලෙස හඳුන්වන යේසුස් මෙලොවට වැඩි සේක. අඩු තරමින් පැති දෙකකින් එතුමන් ජනතාවගේ දුක්වේදනාවන් දුටු සේක. පළමුව, ආගමික බලයේ සිටින අයගේ ඉගැන්වීම්, චාරිත්‍ර වාරිත්‍ර සහ අධිකාරීත්වය නිසා යේසු තුමාගේ සන්දභර්ය තුල අසාධාරණ ලෙස දුක්විදිති. මෙම කරුණු ඔප්පු කිරීමට යෙරුසෙලමේ මාළිගාව පවිත්‍ර කිරීම සඳහා එරිසිවරු වන ආගමික නායකයින් සමඟ ඇති වූ ගැටුම් ප්‍රමාණවත්ය. දෙවන කරුණ නම් තමන් පාලනය කරන රෝම අධිකාරිත්වය සහ රෝම බලය වේ.

තමන්ගේ කාලය තුල එකල සිටි ආගමික නායකයින් හා අධිකාරීන් සමඟ නොයෙක්වර ඇති වූ ගැටුම් යේසුස්ව ප්‍රතික්ෂේප වීමට හේතු සාධක වේ. යේසුතුමාව මරණයට පත්කිරීමේ කුමන්ත්‍රණය,

අධිකාරී බලයේ සිටි ආගමික නායකයින් සහ රෝම අධිරාජ්‍යයේ බලවතුන්ගේ අතින් සිදු විය. ආගමික හා දේශපාලනික ආයතන දෙකම සතුරන් විය. ආගමික සංවිධානයන් සහ බොහෝ බලවත් දේශපාලන අධිකාරීන්ට අභියෝගයක් වූ යේසුස්ව මරාදැමීමට කුමන්ත්‍රණය කිරීම හැර මෙම දෙපළ අතර වෙන පොදුවේ කිසිවක් නොවීය.

එදත් අදත් සිදු වූයේ ද, සිදු වන්නේද, එසේමය. තමන්ට තර්ජනයක් යැයි සිතන ඕනෑම බලවේගයක් විනාශකර දැමීමට ආයතනගත ආගම්, දේශපාලන සහ ආර්ථික බලවතුන් එකට එක්ව කටයුතු කරති. මෙම ද්වන්ද සම්බන්ධතාවය "ආගමික දේශපාලනීයකරණය" සහ "දේශපාලන ආගමිකරණය" යන පැති දෙකෙන්ම අපට දැකගත හැකිය.

යේසුස් ක්‍රිස්තුස්ට සිදු වූයේ මෙයයි. නාසරෙත් ප්‍රකාශනය තුලින් (ලූක් 4 : 18-20) දෙවිදුන්ගේ දර්ශනය ලොවට ගෙනා තම අනුගාමිකයින්ට වටිනාකම් අනුගමනය කරන ලෙස ඉල්ලූ අවුරුදු 33 ක් වයසැති අහිංසක මිනිසාව අත්අඩංගුවට ගෙන නින්දිත ලෙස මරාදමනු ලැබීය. මිනිස් කල්පනාවෙන් බලන කල එය යේසුස්තුමාගේ හා සේවය අවසානයයි. එය එසේ අවසන් නොවීය. ඇයි? දෙවිදුන් මැදිහත්වී යේසුස්ව නැවත නැගිට්ටවූ සේක. පාස්කුව නමින් සමරන උත්සවයේ අර්ථය එම නැවත නැගිටීමේ කතාවයි . පාස්කුව යනු නපුරට නැත කියාද දෙවියන් වහන්සේගේ යුක්ති සහගත ජීවිතයකට ඔව් කියාද වේ. (ක්‍රියා 2:31-32) පේදුරුතුමාගේ ප්‍රකාශනයක් වන දෙවියන්වහන්සේ යේසුතුමාව නැගිට්ටවූ සේක. ඒ සඳහා අපි සාක්ෂිකාරයෝ වෙමු. යන්න තේරුම්ගැනීමට අපව කැඳවා ඇත.

යේසුස් මරණින් නැගිටූ බව අපි සාමාන්‍යයෙන් කියමු. දේවධර්මානුකූලව එය සාවද්‍යය. යේසුස්ව මරණින් නැගිට්ටෙව්වේ දෙවියන් වහන්සේය. මෙම ලෝකය තුල සාක්ෂි දැරීමට අප අදහන විශ්වාස කරන දෙවියන් එතුමන්ය . පාස්කුව යනු දේවාස්ථානයකට අප රැස්වී "යේසුස් නැගිට ඇත". යන්න ප්‍රකාශ කරන දිනයක් පමණක් නොවිය යුතු අතර, එය නැවත නැගිටී යේසුස්තුමා අප ජීවිත තුලට පැමිණ යුක්තියට ඔව් කිමටද, අයුක්තියට නැත කීමටද අපව පරිවර්තනය කරන ධෛර්යමත් කරන දෙවියන්වහන්සේ මාගර්ය පිළිබිඹු කරන දිනයකි.